ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය
Business & Accounting Studies

| 60 | S | I, II |
|---|---|---|

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) තරග විභාගය 2022(2023 මාර්තු)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2022 (2023 மார்ச்)
Genaral Certificate of Education (Ord. Level) Examination, 2022 (March 2023)

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II
வணிகக் கல்வியும் கணக்கீடும் I, II
**Business and Accounting Studies I, II**

පැය තුනයි
*Three hours*

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I

සැලකිය යුතුය :
- (i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- (ii) 1 සිට 40 තෙක් ප්‍රශ්න වල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
- (iii) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය මත (x) ලකුණ යොදන්න.

පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් ප්‍රශ්ණ අංක 01 සිට 03 තෙක් ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න.

අමල් ඖෂධවේදියකු වන අතර සුමල් ප්‍රධාන නගරයක ගොඩනැගිල්ලක හිමිකරුවෙකි. දෙදෙනා එක්ව ලිඛිත ගිවිසුමක් යටතේ "**නීරෝගා**" නමින් ෆාමසියක් ආරම්භ කරන ලදි. ඒ සඳහා එන්ටර්ප්‍රයිසස් ශ්‍රී ලංකා වැඩසටහන යටතේ අඩු පොලියට බැංකු ණයක් ලබා ගන්නා ලදි. තවද ව්‍යාපාරය සඳහා පුහුණු සේවකයකු ද බඳවා ගන්නා ලදි.

01. මෙම සිද්ධියේ සඳහන් වන වුවමනාව වනුයේ,
    - (i) සෞඛ්‍ය
    - (ii) ආරක්‍ෂාව
    - (iii) ඖෂධ
    - (iv) රෝගය

02. අමල් හා සුමල් එකතුව පවත්වාගෙන යන "**නීරෝගා**" ව්‍යාපාරය,
    - (i) සේවා නිෂ්පාදන ව්‍යාපාරයකි.
    - (ii) තනි පුද්ගල ව්‍යාපාරයකි.
    - (iii) භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයකි
    - (iv) සීමිත සමාගමකි

03. අමල් සහ සුමල් ගේ නිෂ්පාදන සම්පත් (සාධක) පිළිවෙලින්,
    - (i) ප්‍රාග්ධනය හා ශ්‍රමය
    - (ii) ශ්‍රමය හා ප්‍රාග්ධනය
    - (iii) ශ්‍රමය, මුදල්
    - (iv) ව්‍යවසායකත්වය, ශ්‍රමය.

04. හවුල් ව්‍යාපාරයක සිටිය යුතු උපරිම සාමාජික සංඛ්‍යාව දක්වා ඇත්තේ,
    - (i) 2007 අංක 7 දරණ සමාගම් පණත.
    - (ii) වංචා වැළැක්වීමේ ආඥා පණත.
    - (iii) 1890 හවුල් ආඥා පණත.
    - (iv) 1972 අංක 05 දරණ සමූපකාර සමිති පණත.

05. අමාත්‍යාංශ යටතේ ක්‍රියාත්මක වන මුළු මනින්ම රජයේ සෘජු පාලනයට අයත්වන ආයතන,
    - (i) රාජ්‍ය සංස්ථා
    - (ii) සමූපකාර සමිති
    - (iii) රාජ්‍ය දෙපාර්තමේන්තු
    - (iv) රාජ්‍ය සමාගම්

06. ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ බලධරයා වන්නේ,
    - (i) සමාගම් රෙජස්ට්‍රාර්වරයා ය.
    - (ii) අදාළ පළාත් සභාවේ මහ ඇමතිවරයා ය.
    - (iii) අදාළ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ය.
    - (iv) අදාළ පළාත් සභාවේ ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර්වරයා

❖ ව්‍යාපාර සංවිධාන කෙරෙහි බලපාන පණත් කිහිපයක් පහත වේ.

A - 2007 අංක 7 දරණ සමාගම් පණත
B - 1890 හවුල් ආඥා පණත
C - 1972 අංක 05 දරණ සමූපකාර සමිති පණත
D - 1840 වංචා වැළැක්වීමේ පණත

07. මින් හවුල් ව්‍යාපාර කෙරෙහි බලපාන පණත් වනුයේ,
(i) A පමණි. (ii) B පමණි. (iii) A, B හා C පමණි. (iv) A, B හා D පමණි

08. පාසල් ශිෂ්‍යයෙකු තම අවශ්‍යතාවය සඳහා පොත් 10ක් පාසල් සමූපකාරයෙන් ලබා ගැනීම.........(01)....... වන අතර, තිරිඟු පිටි, ඉන්ධන, සුවඳ විලවුන් විදේශ රටවලින් මිලට ගැනීම ..........(02)............ නම් වේ.
(i) තොග වෙළෙඳාම, අපනයන වෙළෙඳාම
(ii) තොග වෙළෙඳාම, ආනයන වෙළෙඳාම.
(iii) සිල්ලර වෙළෙඳාම, අපනයන වෙළෙඳාම
(iv) සිල්ලර වෙළෙඳාම, ආනයන වෙළෙඳාම

09. පහත දැක්වෙන්නේ ඉතිරිකිරීම් ගිණුමක හා ජංගම ගිණුමක ප්‍රයෝජන කිහිපයකි.
A - තැන්පතු සඳහා පොලී ආදායම හිමිවීම
B - අයිරා පහසුකම් ලබා ගත හැකි වීම
C - ස්ථාවර නියෝග නිකුත් කළ හැකි වීම
D - චෙක්පත් මගින් ගනුදෙනු කළ හැකි වීම
E - හරපත් මගින් ගනුදෙනු කළ හැකි වීම.

ඉහත සඳහන් කරුණු අතරින් ඉතිරිකිරීම් ගිණුම්වල ප්‍රයෝජන ඇතුළත් පිළිතුර වන්නේ,
(i) A, B, E (ii) A, C, D (iii) A, C, E (iv) A, D, E

10. කොළඹ කොටස් හුවමාරුවේ ප්‍රධාන කාර්යභාරය වන්නේ,
(i) කොළඹ කොටස් වෙළෙඳ පොල කටයුතු අධීක්ෂණය හා විධිමත් කිරීම.
(ii) කොළඹ කොටස් වෙළෙඳ පොලේ ලියාපදිංචි සමාගම්වල ගනුදෙනු මෙහෙය වීම.
(iii) ආයෝජකයන් සුරක්ෂිත කිරීම.
(iv) කොටස් වෙළෙඳපොල කටයුතු විධිමත්ව හා සාධාරණව පවත්වාගෙන යාම.

11. රක්ෂණ හිමිකම සම්බන්ධව වැරදි ප්‍රකාශය තෝරන්න.
(i) ස්වාමි පුරුෂයා හා භාර්යාව අතර එකිනෙකාගේ ජීවිත පිළිබඳ රක්ෂ්‍ය හිමිකමක් ඇත.
(ii) දේපළ රක්ෂණයේ දී, එම දේපළ නීත්‍යානුකූල අයිතිකරුවන්ට රක්ෂ්‍ය හිමිකමක් ඇත.
(iii) නීත්‍යානුකූල ගනුදෙනුවක දී, ණය දුන් තැනැත්තෙකුට දෙන ලද ණය ප්‍රමාණය දක්වා ණය ලබා ගත් තැනැත්තාගේ ජීවිතය රක්ෂණය කිරීමට හිමිකමක් ඇත.
(iv) ඕනෑ ම දරුවෙකුගේ ජීවිතය රක්ෂණය කිරීමට එම දරුවාගේ දෙමාපියන්ට රක්ෂ්‍ය හිමිකමක් ඇත.

12. විද්‍යුත්, වාචික සහ ලිඛිත යන මාධ්‍යයන් තුනට ම අයත් සන්නිවේදන ක්‍රමයක් වන්නේ,
(i) දැන්වීම් ය. (ii) දුරකථන සංවාද (iii) විද්‍යුත් තැපැල ය. (iv) වට්ස්ඇප්

13. ප්‍රවාහන ක්‍රමවල වාසි හා අවාසි කිහිපයක් පහත දැක්වේ.
A - ගමනාන්තය දක්වා යොදා ගත හැකි වීම.
B - ඕනෑම වේලාවක යොදා ගත හැකි වීම
C - මාර්ග තදබදයක් ඇති නොවීම
D - සාපේක්ෂව මාර්ග අනතුරු සංඛ්‍යාව අඩු වීම.

මහාමාර්ග ප්‍රවාහන ක්‍රමයේ වාසි පමණක් දැක්වෙන ප්‍රකාශය වන්නේ,
(i) A පමණි. (ii) A හා B පමණි (iii) A, B, හා C පමණි. (iv) A, C, හා D පමණි.

14. පහත සඳහන් ප්‍රකාශ අතරින් සත්‍ය ප්‍රකාශය තෝරන්න.
(i) පාරිභෝගිකයාට එදිනෙදා අවශ්‍ය භාණ්ඩ, අවශ්‍ය ප්‍රමාණයට විකිණීම තොග වෙළෙඳාමේ ලක්ෂණයකි.
(ii) සිල්ලර මිලට සාපේක්ෂව තොග මිල වැඩි ය.
(iii) පාසල් සමූපකාරයට භාණ්ඩ මිලට ගැනීම සිල්ලර වෙළෙඳාමට අයත් ය.
(iv) සිල්ලර වෙළෙඳාම හා තොග වෙළෙඳාම අතර වෙනස පවතින්නේ ගැණුම්කරුවන්ගේ චේතනාව මත ය.

15. පාලිත විසින් මුරුංගා පත්‍ර උපයෝගි කරගෙන ශරීරයට හිතකර පානයක් සකස් කර වෙළෙඳ පොලට ඉදිරිපත් කරයි. මේ සඳහා ආයුර්වේද වෛද්‍යවරයෙක් මාර්ගයෙන් රෝගීන් දැනුවත් කිරීම සඳහා දේශණයක් පවත්වන ලදි. මෙම සිද්ධිය තුළින් මතුවන අළෙවිකරණ මිශ්‍රයේ විචල්‍ය දෙකක් වන්නේ,
(i) නිෂ්පාදිතය, මිල (ii) ස්ථානය, නිෂ්පාදිතය
(iii) ප්‍රවර්ධනය, නිෂ්පාදිතය (iv) ස්ථානය, ප්‍රවර්ධනය

16. භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනයෙන් ලැබෙන ප්‍රතිලාභයක් වන්නේ,
(i) ලාභාංශ ලැබීම (ii) ප්‍රාග්ධන ලාභ ලැබීම.
(iii) ඡන්ද බලය හිමි වීම (iv) පූර්ණ ආරක්ෂාවක් ලැබීම.

17. පහත දක්වා ඇති ගනුදෙනු අතරින් වත්කම්, වගකීම් හා හිමිකම් යන සියල්ලම වෙනස්වන ගනුදෙනුව තෝරන්න.
(i) සමන්ගෙන් රු. 5,000ක තොගයක් ණයට ගැනීම.
(ii) ණයහිමි අමල්ට රු. 3,000ක් මුදලින් ගෙවීම.
(iii) බැංකුණය සඳහා රු. 1,000 ක පොලිය ද සමග වාරිකය ගෙවීම.
(iv) රු. 1,000ක විදුලි බිල ගෙවීම.

18. අයිතිකරු තම පෞද්ගලික මුදලින් ණයහිමියන්ට රු. 10,000ක් ගෙවීම මෙම ගනුදෙනවේ බලපෑම නිවැරදිව ගිණුම්කරණ සමීකරණය තුල දක්වා අති පිළිතුර වන්නේ,

| | වත්කම් | = | අයිතිකරුගේ හිමිකම | + | වගකීම් |
|---|---|---|---|---|---|
| (i) | - 10,000 | = | | | - 10,000 |
| (ii) | - 10,000 | = | - 10,000 | | |
| (iii) | | = | +10,000 | | +10,000 |
| (iv) | | = | +10,000 | | - 10,000 |

19. ගනුදෙනුවක් සටහන් කිරීමට අදාල ද්විත්ව සටහන පහත දැක්වේ.
ණයගැති ගිණුම හර රු. 8,000
විකුණුම් ගිණුම බැර රු. 8,000

මෙම ගනුදෙනුව වන්නේ,
(i) රු. 8,000 ක් භාණ්ඩ ණයට විකිණිම (ii) රු. 8,000 ක් භාණ්ඩ ණයට ගැනීම
(iii) රු. 8,000 ක් භාණ්ඩ අත්පිට විකිණීම (iv) රු. 8,000 ක් භාණ්ඩ අත්පිට මිලදී ගැනීම.

20. මාධවිගේ ව්‍යාපාරයේ ණයහිමියකු වු නිමල් ට රු. 20,000ක ණය පියවීමේ දී 5% වට්ටමක් හිමි විය. මෙය මාධවිගේ ව්‍යාපාරයේ,
(i) රු. 1,000 ක දුන් වට්ටම කි. (ii) රු. 1,000 ක ලද වට්ටමකි
(iii) රු. 2,000 ක දුන් වට්ටම කි. (iv) රු. 2,000ක ලද වට්ටමකි.

21. අයිතිකරු පෞද්ගලික ප්‍රයෝජනය සඳහා රු. 2,000ක භාණ්ඩ රැගෙන යාම මෙම ගනුදෙනුව සටහන් කිරීමට අදාල මුලාශ්‍ර ලේඛණය හා මූලික සටහන් පොත පිළිවෙලින් දැක්වෙන්නේ,
(i) ගෙවීම් වවුචරය, මුදල් පොත (ii) ගෙවීම් වවුචරය, පොදු ජ'නලය
(iii) ජ'නල් වවුචරය, පොදු ජ'නලය (iv) ජ'නල් වවුචරය, මුදල් පොත

22. ව්‍යාපාරයක සුළු මුදල් භාරකරු සන්තකයේ 2023.01.01 දින රු. 250ක් ඉතිරිව තිබුණි. ප්‍රධාන මුදල් භාරකරු එදින රු. 4,750 ක් දී එය ප්‍රතිපූරණය කරන ලදි. මාසය අවසානයේ සුළු මුදල් භාරකරු ළග රු. 850ක් ඉතිරිව තිබුණි. ඊළග මාසයේ දී ප්‍රධාන මුදල් භාරකරු විසින් ප්‍රතිපූර්ණය කළ යුතු මුදල වන්නේ,
(i) රු. 4,750 (ii) රු. 4,150 (iii) රු. 850 (iv) රු. 250

23. ලද චෙක්පතක් බැංකු ගිණුමේ තැන්පත් කිරීමට අදාල නිවැරදි ද්විත්ව සටහන තෝරන්න.
(i) බැංකු ගිණුම හර
මුදල් පොත බැර
(ii) මුදල් පොත හර
බැංකු ගිණුම බැර
(iii) බැංකු ගිණුම හර
ප්‍රාග්ධන ගිණුම බැර
(iv) ප්‍රාග්ධන ගිණුම හර
බැංකු ගිණුම බැර

24. කවීෂාගේ ව්‍යාපාරයේ බැංකු ගිණුම 2023.02.28 දිනට රු. 31,000ක හර ශේෂයක් පෙන් වූ නමුදු බැංකු ප්‍රකාශයට අනුව ගිණුමේ ශේෂය රු. 38,000 කි. ඉහත වෙනසට බලපෑ හැකි හේතුව,
   (i) බැංකු ගාස්තු රු. 7,000 ක් ගෙවීමයි.
   (ii) ස්ථාවර නියෝග මග රු. 7,000ක රක්ෂණ වාරිකය ගෙවීමයි.
   (iii) ණයගැති ප්‍රේෂණ රු. 7,000ක් ලැබීම යි.
   (iv) බැංකු ණය වාරිකය ලෙස රු. 7,000ක් අය කර ගැනීමයි.

25. පහත ගනුදෙනු අතරින් ගැණුම් ජ්'නලයේ සටහන් කරනුයේ,
   (i) රු. 5,000ක ලියන මේසයක් ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා ණයට ලබා ගැනිම
   (ii) රු. 12,000ක භාණ්ඩ නැවත විකිණීමට ණයට ලබා ගැනීම
   (iii) රු. 12,000ක භාණ්ඩ නැවත විකිණීමට මුදලට ලබා ගැනීම
   (iv) රු. 5,000ක ලියන මේසයක් ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා අත්පිට මිලදී ගැනීම.

26. පහත දැක්වෙන්නේ ගිණුම්කරණයේ සිදුවූ වරදක් නිවැරදි කිරීමට අදාල පොදු ජ්'නලයෙන් උපුටා ගත් සටහනකි.

   අවිනිශ්චිත ගිණුම (හර) රු. 12,000
   ණයගැති ගිණුම (බැර) රු. 12,000

   ව්‍යාපාරයේ ගිණුම් පොත් වල සිදුවී ඇති වරද වන්නේ,
   (i) ණයගැති ගිණුමේ සටහන් ව නොතිබූ රු. 12,000 ණයට විකුණුම් සටහන් කිරිම.
   (ii) ණයගැතියකුගෙන් ලද රු. 12,000 ණයගැති ගිණුමේ හරට සටහන් කිරිම.
   (iii) ණයගැතියකුගෙන් ලද රු. 6,000 මුදල් පොතට හා ණයගැති ගිණුමට හර කර තිබිම.
   (iv) ණයගැතියකුගෙන් ලද රු. 12,000 මුදල, ණයගැති ගිණුමට රු. 1,200 ක් ලෙස සටහන්ව තිබිම.

❖ රු. 4,000 ක ණයට විකුණුම්, අදාළ ගිණුම් දෙකේම බැරට සටහන් වී ඇත.

27. ඉහත සඳහන් වැරැද්ද නිසා ශේෂ පිරික්සුමට සිදු වූ බලපෑම වන්නේ,
   (i) ශේෂ පිරික්සුමේ හරට රු. 4,000ක් අඩු වීම ය. (ii) ශේෂ පිරික්සුමේ බැරට රු. 4,000ක් අඩු වීම ය.
   (iii) ශේෂ පිරික්සුමේ හරට රු. 8,000ක් අඩු වීම ය. (iv) ශේෂ පිරික්සුමේ බැරට රු. 8,000 ක් අඩු වීම ය.

28. පහත හිස්තැන සඳහා නිවැරදි පිළිතුර තෝරන්න.
   **ප්‍රාථමික පිරිවැය + ............................ = මුළු නිෂ්පාදන පිරිවැය**
   (i) සෘජු පිරිවැය (ii) සෘජු ද්‍රව්‍ය පිරිවැය (iii) පොදුකාර්ය පිරිවැය (iv) වක්‍ර ද්‍රව්‍ය පිරිවැය

29. පහත ඒවා අතරින් සෘජු පිරිවැයක් වන්නේ,
   (i) මුද්‍රණ ආයතනයක විදුලි වියදම
   (ii) බේකරියක රක්ෂණ වියදම
   (iii) සහල් මෝලක නඩත්තු වියදම
   (iv) ඇඳුම් මැසීමේ ව්‍යාපාරයක රෙදි සඳහා වන වියදම

30. ළමා පුටු නිෂ්පාදන ආයතනයක 2023 ජනවාරි මාසයේ මුළු නිෂ්පාදන පිරිවැය රු. 150,000 ක් වූ අතර මාසය තුළදී නිෂ්පාදනය කළ ළමා පුටු ගණන 500 කි. ළමා පුටුවක නිෂ්පාදන පිරිවැය මත 20%ක ලාභාංතිකයක් තබා ගන්නේ නම් ළමා පුටුවක විකුණුම් මිල කොපමණ ද ?
   (i) රු. 240 (ii) රු. 300 (iii) රු. 360 (iv) රු. 500

31. පහත සඳහන් වියදම් අතරින් ප්‍රාග්ධන වියදමක් ලෙස සැලකිය හැක්කේ,
   (i) ලී බඩු අලුත්වැඩියාවට වැය වූ මුදල (ii) ලී බඩු මිලදී ගැනීමට වැය වූ මුදල
   (iii) ලී බඩු තීන්ත ගෑමට වැය වූ මුදල (iv) ලී බඩු විකිණීමේ දී ලබා දුන් කොමිස් මුදල

32. සමගි ක්‍රීඩා සමාජය ලාභ නොලබන සංවිධානයක් ලෙස පිහිටුවා ඇත. එහි සාමාජිකයින් 100 දෙනෙකු සිටින අතර වාර්ෂික සාමාජික ගාස්තුව රු. 100 කි. සාමාජිකයින් 10 දෙනෙකු මෙම වර්ෂයේ සාමාජික මුදල් ගෙවා නොමැත. මෙම ක්‍රීඩා සමාජයේ ලැබීම් හා ගෙවීම් ගිණුමේ සටහන් කෙරෙන සාමාජික මුදල වන්නේ,

(i) රු. 10,000 කි. (ii) රු. 9,000 කි. (iii) රු. 1,000 කි. (iv) රු. 900 කි.

33. ජයමග ක්‍රීඩා සමාජයේ 2022.01.31 දිනට සාමාජික සංඛ්‍යාව 100 කි. එක් අයකුගේ මාසික සාමාජික ගාස්තුව රු. 50 කි. 2022 වර්ෂය තුළ සාමාජිකයන් 20 මුදල් ගෙවා නැත. මෙම ක්‍රීඩා සමාජයට අදාළ නිවැරදි ප්‍රකාශය වන්නේ,

(i) ලැබීම් හා ගෙවීම් ගිණුමේ ඇතුළත් වන මුදල වන්නේ රු. 60,000 කි.
(ii) ආදායම් ප්‍රකාශණයේ සටහන් කළ යුතු ආදායම රු. 60,000 කි.
(iii) ලැබීම් හා ගෙවීම් ගිණුමේ ඇතුළත් කළ යුතු සාමාජික මුදල් රු. 5,000 කි.
(iv) ආදායම් ප්‍රකාශණයේ ඇතුළත් කළ යුතු සාමාජික මුදල් රු. 5,000 කි.

34. 2023.01.01 දින සචිනිගේ ව්‍යාපාරය රු. 800,000ක් වටිනා වාහනයක් මිලදී ගත් අතර, සුන්බුන් අගය රු. 100,000ක් විය. වාර්ෂික ක්ෂය වටිනාකම රු. 70,000 ක් නම්, එහි ඵලදායි අපේක්ෂිත ජීව කාලය කොපමණද ?

(i) අවු. 07 (ii) අවු. 08 (iii) අවු. 09 (iv) අවු. 10

❖ පහත තොරතුරු ඇසුරෙන් අංක 35 සිට 40 දක්වා ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න.
පාරමීගේ වෙළෙඳ ව්‍යාපාරයේ 2022.12.31 දිනට පිළියෙළ කළ ශේෂ පිරික්සුම පහත දැක්වේ.

**ශේෂ පිරික්සුම**

| | | |
|---|---|---|
| ප්‍රචාරණය | 12,000 | |
| වරිපනම් බදු | 8,000 | |
| ගැණුම් | 460,000 | |
| 01.01.2022 තොගය | 26,000 | |
| විකුණුම් | | 625,000 |
| ප්‍රාග්ධනය | | 320,000 |
| මුදල් ශේෂය | 28,000 | |
| බැංකු අයිරාව | | 14,000 |
| ණයගැතියෝ | 90,000 | |
| ණයහිමියෝ | | 105,000 |
| ගෙනඒමේකුලී | 7,000 | |
| විදුලිය | 12,000 | |
| වෙළෙඳ සේවක වැටුප් | 17,000 | |
| මෝටර් රථය | 400,000 | |
| බොල් ණය | 4,000 | |
| | 1,064,000 | 1,064,000 |

අමතර තොරතුරු

- ❖ 2022.12.31 දිනට ඉතිරි බඩුතොගය රු. 43,000 යි.
- ❖ තවත් බොල්ණය රු. 2,000 ක් කපා හල යුතුය.
- ❖ විදුලිබිල රු. 4,000 උපචිත ව පවතී.
- ❖ අයිතිකරුගේ මුදල් ගැනිලි රු. 10,000 යි.

35. මෙම ව්‍යාපාරයේ 2022.12.31 න් අවසන් වර්ෂයේ ලාභාලාභ ප්‍රකාශයේ බෙදාහැරීම් වියදම්වල එකතුව වන්නේ,

(i) රු. 12,000 (ii) රු. 16,000 (iii) රු. 33,000 (iv) රු. 35,000

36. මෙම ව්‍යාපාරයේ විකුණුම් පිරිවැය වන්නේ,

(i) රු. 625,000 (ii) රු. 493,000 (iii) රු. 460,000 (iv) රු. 450,000

37. මෙම ව්‍යාපාරයේ ජංගම වගකීම් වල එකතුව වන්නේ,

(i) රු. 103,000 (ii) රු. 105,000 (iii) රු. 119,000 (iv) රු. 123,000

38. මෙම ව්‍යාපාරයේ ශුද්ධ ලාභය වන්නේ,

(i) රු. 116,000 (ii) රු. 118,000 (iii) රු. 122,000 (iv) රු. 44,000

39. ව්‍යාපාරයේ මෝටර් රථය වාර්ෂිකව 10% බැගින් සරලමාර්ග ක්‍රමයට ක්ෂය කරයි නම් නිවැරදි ක්ෂය වට්නාකම සහිතව ද්විත්ව සටහන වන්නේ,

(i) මෝටර් රථ ගිණුම හර රු. 40,000
    මෝටර් රථ ක්ෂය ගිණුම බැර රු. 40,000

(ii) මෝටර් රථ ක්ෂය ගිණුම හර රු. 40,000
    මෝටර් රථ ගිණුම බැර රු. 40,000

(iii) මෝටර් රථ ක්ෂය ගිණුම හර රු. 40,000
    මෝටර් රථ ක්ෂය වෙන් කිරීමේ ගිණුම බැර රු. 40,000

(iv) මෝටර් රථ ක්ෂය වෙන් කිරීමේ ගිණුම හර රු. 40,000
    මෝටර් රථ ක්ෂය ගිණුම හර රු. 40,000

40. 2022.12.31 දිනට ව්‍යාපාරයේ මුළු හිමිකම වන්නේ,

(i) රු. 320,000 (ii) රු. 426,000

(iii) රු. 436,000 (iv) රු. 438,000

සා.පෙළ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන දේශක
සිසිර කුමාර
විසින් සම්පාදිත යි.